පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2018/13 (i)

මගේ අංකය: -එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/06
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2025.09. 03

උතුරු මැද පළාත් සභාවේ සියළුම ලේකම්වරුන් හා,
ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානීන් වෙත.

**උතුරු මැද පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරී ආයතනවල නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම්**

උක්ත හිසින් යුතු 2018.04.17 දිනැති අංක 2018/13 දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 02 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

**" 02. ප්‍රවාහන දීමනා**

උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය යන ආයතනවල සභාපතිවරුන්ට හා සාමාන්‍යාධිකාරීවරුන්ට අනුයුක්ත කළ වාහන හෝ සංචිත වාහන ප්‍රවාහන කටයුතු සඳහා යොදා නොගන්නේ නම් පමණක් තම පෞද්ගලික වාහනය රාජකාරි ගමන් සඳහා යොදා ගැනීම වෙනුවෙන් මාසිකව රු.50,000.00 ක ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකි වේ. කර්මාන්ත සංවර්ධන අධිකාරිය හා මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය යන ආයතනවල සභාපතිවරුන්ට පමණක් සංචිත වාහන හා අනුයුක්ත කළ වාහන තම රාජකාරි ගමන් සඳහා යොදා නොගන්නේ නම් පමණක් රාජකාරි ගමන් සඳහා තම පෞද්ගලික වාහනය යොදා ගැනීම වෙනුවෙන් මාසිකව රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකි වේ."

02. එම චක්‍රලේඛයේ අනෙකුත් විධිවිධාන ඒ ආකාරයටම බලපැවැත්වේ.

03. මෙම චක්‍රලේඛය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කරනු ලබන අතර මෙම සංශෝධනය 2025/09/01 දින සිට බලපැවැත්වේ.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත් :

01. විගණකාධිපති - දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.